# ටෙන්ඩර් දැන්වීම

# කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

## කුරුඳු අස්වැන්න කපා ඉවත් කර ගැනීම සඳහා මිල ගණන් කැඳවීම

කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් මාතර, පලොල්පිටිය ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ අක්කර 10 ක පමණ වූ ක්ෂේත්‍රයක කුරුඳු අස්වැන්න කපා ඉවත් කර ගැනීම සඳහා ප්‍රසිද්ධ මිල ගණන් කැඳවනු ලැබේ.

මිල ගණන් ඉදිරිපත් කළ යුත්තේ මෙම දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ටෙන්ඩර් ආකෘති පත්‍රයක් මඟින් පමණක් වේ. මේ සඳහා ආපසු නොගෙවන රු. 1,000.00 ක ගාස්තුවක් මෙම දෙපාර්තමේන්තුවේ කරන්දෙණිය ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත හෝ මාතර, පලොල්පිටිය ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ ස්ථානභාර නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත ගෙවා ටෙන්ඩර් ආකෘති පත්‍ර, ටෙන්ඩර් කොන්දේසි හා උපදෙස් ඇතුළත් ලියවිලි ලබා ගත හැක.

මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී ආපසු ගෙවනු ලබන රු. 15,000.00 ක ඇප තැන්පතුවක් මෙම දෙපාර්තමේන්තුවේ සරප් වෙත හෝ මාතර, පලොල්පිටිය ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ ස්ථානභාර නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) වෙත ගෙවා එම ලදුපත ද මිල ගණන් පත සමග ඉදිරිපත් කළ යුතු ය.

සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් මුද්‍රා තබන ලද ලියුම් කවරයක බහා එහි වම් පස උඩ කෙළවර ,**"කුරුඳු අස්වනු නෙළීම - මිල ගණන්"**යනුවෙන් සඳහන් කර **2026 අගෝස්තු 31 දින ප.ව. 02.00** ට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කළමනාකරණ අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක.

මිළ ගණන් විවෘත කිරීම 2026 අගෝස්තු 31 දින ප.ව. 02.15 ට සිදු කෙරේ.

අධ්‍යක්ෂ ජනරාල්

කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව